# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,914 — 1932ක්වූ මාර්තු මස 23 වෙනි දිනවූ බදාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කාවශ්‍යතාකට, එනම්:—කටුගස්තොට-පල්ලෑපත්වල පාරේ හැතැප්ම 11වෙනි කනුව අසල සේදී කැඩිගොස් තිබෙන පාර අලුතුවෙන් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 9,174. ගම—හාරසියපත්තුවේ උඩගම්පහකෝරලයේ අඹුවතුගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කිත්ගහවත්ත .. | වැව්ලිකර තිබෙන ඉඩම .. | ගාල්ලේ ඩී. බී. මීජේස්කාරයේ උරුමක්කාරයෝ .. | 0 0 29·4 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ අප්‍රේල් මස 22වෙනි දින පස්වරූ 2ගේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකමද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ මාර්තු මස 19වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොඩිගෝල්,
මහනුවර උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කාවශ්‍යතාකට, ඒනම්:—දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ වැල්ලබඩපත්තුවේ දෙවුන්දර සනිපාරක්‍ෂක සභා සීමාතුළ දෙවුන්දර බස්නාහිර සින්හාසනවැල්ල පාරේ සිට අඩිපාරක් කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. 14,398. ගම—දෙවුන්දර බස්නාහිර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අහන්ගමලමයගේවත්ත (වරිපනම් නොම්මර 1,054 කොටසක්) | පොල්ගසක් තිබෙන වත්ත | දෙවුන්දර පදිංචි (1) කේනාබදුගේ බබප්පු, (2) හෙන්දු විතාරනගේ බබුන්හාමි සහ (3) ඩබ්ලිව්. ඇල්. පී. දවිත්අප්පු | 0 0 0·49 |
| 2 | ජනෝ පදිංචි ගෙදරවතත (වරිපනම් නොම්මර 1,028 කොටසක්) | එම .. | දෙවුන්දර පදිංචි ඩබ්ලිව්. පී. සලෝහාමි සහ ඒ. බී. කාරොන්චිහාමි | 0 0 0·15 |
| 3 | මාතරබද්දගේවත්ත (වරිපනම් නොම්මර 1,053 කොටසක්) | එම .. | (1) දෙවුන්දර පදිංචි පී. ඇම්. චන්තුහාමි, (2) මිරිස්සේ පදිංචි පී. ඇම්. බබාහාමි, දෙවුන්දර පදිංචි (3) පී. ඇම්. තිසෙල්හාමි, (4) ජී. ලැසිසිහාමි, (5) පී ඇම්. අප්පුසිඤ්ඤෝ, (6) පී. ඇම්. දියෝනිස්අප්පු, 7) පී. ඇම්. ජේම්ස්අප්පු, (8) පී. ඇම්. දවිත්සිඤ්ඤෝ, (9) පී. ඇම්. සොපිනෝනා සහ (10) පී. ඇම්. බබිනෝනා | 0 0 0·85 |

149——J. N. 17986—120 (3/32)
S 1

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | එරමුදුගහවත්ත (පිඹුරු නම්බර 1,050 කොටසක්) | පොල්ගහක් තිබෙන වත්ත | දෙවුන්දර පදිංචි (1) හෙන්දවිතාරණගේ කාලුඅප්පු, (2) ඩබ්ලිව්. ඇන්. පී. සලෝහාමි සහ (3) එච්. ඩබ්ලිව්. බබුන්හාමි | 0 0 0·71 |
| 5 | ඇල්ලලගේවත්ත (පිඹුරු නම්බර 1,043 කොටසක්) | පොල්ගස් දෙකක් තිබෙන වත්ත | දෙවුන්දර පදිංචි (1) ඒ. ඩබ්ලිව් ඇස්. පී. අන්දිරිස්, (2) ඒ. ඩබ්ලිව්. ඇස්. පී. නෝනබබා, (3) ඒ. ඩබ්ලිව්. ඇස්. පී. බබානෝනා | 0 0 1·16 |
| 6 | ජනෝ පදිංචිගෙදරවත්ත (පිඹුරු නම්බර 1,028 කොටසක්) | වත්ත (වැවිල්ලක් නොමැතිසි) | දෙවුන්දර පදිංචි (1) ඩබ්ලිව්. පී. සලෝහාමි සහ (2) ඒ. බී. කාරොන්චිහාමි | 0 0 0·25 |
| 7 | එරමුදුගහවත්ත (පිඹුරු නම්බර 1,034 කොටසක්) | පොල්ගසක් තිබෙන වත්ත | දෙවුන්දර පදිංචි සූරියපටබැඳිගේ හින්හාමි .. | 0 0 0·75 |
| 8 | මුරුන්ගහකොරටුව (පිඹුරු නම්බර 1,032 කොටසක්) | වත්ත (වැවිල්ලක් නොමැතිසි) | දෙවුන්දර පදිංචි ඩබ්ලිව්. ඒ. අර්නෝලිස්අප්පු .. | 0 0 0·55 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරන අය වර්ෂ 1932ක්වූ අප්‍රේල් මස විසිඑක්වෙනි දින උදේ 10.30ගේ කාලසමට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ මාර්තු මස 16වෙනි දින
මාතර කච්චේරියේදීය.

එච්. ජේ. ඇල්. ලික්ලෙයාර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍ගය.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒ තම් :—වැසිකිළියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස වර්ෂ "1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

නොම්මර 210 දරණ ගම් තිරවුල්කිරීමේ සිතියමෙත් උපුටාගන්නාලද නොම්මර 1 දරණ සිතියම.
ගම—හොරම්බාව, මැද්දේකැටියේකෝරලේ කටුගම්පොලහත්පත්තුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 13B | හැවනඹිවිට .. | ඔවිට .. | පී. පී. බන්ඩියා .. | .. 0 0 1·6 |
| 11B1 | හැවනමුල්ලවත්ත .. | එම .. | එම .. | .. 0 0 10 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ මැයි මස 4වෙනි දින පෙරවරු 10ගේ කාලසමට දණ්ඩගමුවේ කානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ මාර්තු මස 16වෙනි
දින කුරුණෑගල කච්චේරියේදීය.

ජේ. ආර්. වෝල්ටර්ස්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වර්‍ගය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.